**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය- සංරචක 02 (පළාත් මාර්ග වැඩිදියුණු කිරීම) - 2020**

**------------------------------------------------------------------------------------------------------------**

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - සංරචක 02 ( පළාත් මාර්ග වැඩිදියුණු කිරීම) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2017 සැප්තැම්බර් 29 දින එළඹි අංක 5788 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 01 හි 4.2 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව, එවකට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සියලුම පළාත් මාර්ග අධිකාරීන් සංශෝධිත සංරචක 02 ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ වත්කම් කළමනාකරණ පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම හා පළාත් මාර්ග සඳහා ප්‍රවේශ හා කළමනාකරණ රාමුව වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,875කට සමාන එජඩො මිලියන 125ක් වේ. ව්‍යාපෘතියේ සංශෝධිත මූල්‍ය ගිවිසුමට අනුව, සංශෝධිත සංරචක 02 හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 19,075 කට සමාන එජඩො මිලියන 109ක් වේ. සංරචක එහි කටයුතු 2019 මැයි 02 දින ආරම්භ කර තිබුණු අතර 2023 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි.

## 1.3 තත්ත්වාගණන කළ මතය

මාගේ වාර්තාවේ 2 වගුවේ දැක්වෙන කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණන කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම් ලෙස එකතුව රු. මිලියන 600.45 ක් පෙන්වා තිබුණද, එය තුළ කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ලෙස නොගෙවන ලද රු.මිලියන 61.34 ක් ඇතුළත්ව තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම මුදලින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම් ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. | 61.34 | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.මිලියන 47.61 ක මුදලක් 2020 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම් එකතුව රු. මිලියන 600.45 ඇතුළත් වී තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී උපදේශන සේවාව සඳහා ගෙවන ලද රු. මිලියන 47.84 ක සත්‍ය මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.මිලියන 53.09 ලෙස වැරදියට දක්වා තිබුණි. | 5.25 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කිරීම සඳහා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | -එම- |

### 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2018 අගෝස්තු 15 දිනැති අංක 18/1682/805/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ලබා දී ඇති උපදෙස් පරිදි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ කිසිවකු පත්කර නොතිබුණි. | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා සුදුසු අමාත්‍යාංශය කාර්ය මණ්ඩලයක් අන්තර්ග්‍රහනය කිරීම අත්‍යවශ්‍ය අවශ්‍යතාවක් නොවේ. | අමාත්‍ය මණ්ඩල තීරණය සමග අනුකූලවීම අවශ්‍ය වේ. |
| (ආ) | 2019 මාර්තු 05 දිනැති 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | ව්‍යාපෘති සමාලෝචන කමිටු මාස 2කට වරක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් පවත්වා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් නිරන්තරයෙන් පැවැත්වීමට අවශ්‍ය වේ. |
| (ඇ) | 2019 ජනවාරි 12 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | වර්ෂය තුළදී කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් වාර 01 ක් පමණක් පවත්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | කළමනාකරණ හා විගණන කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 වගන්තිය | පැමිණීම සහ පිටවීම තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතුය. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ කළමනාකරණ ඒකකයට සම්බන්ධ නිලධාරීන් 13 දෙනෙකු සහ උපදේශකවරු 4 දෙනෙකු පැමිණීම තහවුරු කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | අවශ්‍ය පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් සමග අනුගතවීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

### 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂය තුළදී කිලෝමීටර 302 දිගකින් යුතු මාර්ග 67 ක් ඉදිකිරීම් සඳහා රු.මිලියන 7,692.30 ක් වටිනා කොන්ත්‍රාත් පැකේජ 18ක් පිරිනැමීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, වර්ෂය තුළදී කොන්ත්‍රාත් පැකේජ 08 ක් පමණක් පිරිනමා තිබුණි. ඉතිරි කොන්ත්‍රාත් පැකේජ 10 සමාලෝචිත වර්ෂය තුළදී පිරිනමා තිබුණි. කෙසේවෙතත් සමාලෝචිත වර්ෂය තුළදී ඉන් කොන්ත්‍රාත් පැකේජ 06 ක කිසිදු භෞතික ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි. | අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවට මගින් මිල විචලනයක් සමාලෝචනය සඳහා කාලය ගත වී තිබේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය කඩිනම් කිරීමට සහ ඉදිකිරීම්වල සාධනීය භෞතික ප්‍රගතියක් පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ප්‍රතිව්‍යුහගත කිරීමේ පත්‍රිකාවට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී අදියර 2 සඳහා රු.මිලියන 7,769.86 ක පිරිවැයකට මාර්ග හඳුනාගෙන විස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමට ව්‍යාපෘතියට සිදු වී තිබුණි. කෙසේවෙතත්, කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ව්‍යාපෘති සැලැස්ම සමග අනුගතවීමට පියවර ගත යුතුය. |

### 3.2 මතභේදයට තුඩුදෙන ගැටලු

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2007 උපදේශකවරු තෝරා ගැනීම සහ සේවයේ යෙදවීම සඳහා වූ මාර්ගෝපදේශයට අනුව තනි පුද්ගල උපදේශකවරු පත් කළ යුතු වුවද, නේවාසික ඉංජිනේරු සහ කොන්ත්‍රාත් කළමනාකරණ උපදේශකවරුන් 9, කොන්ත්‍රාත් කළමනාකරණ හා අධීක්ෂණ උපදේශකවරුන් 3, ද්‍රව්‍ය ඉංජිනේරු සහ | අදහස් දක්වා නොමැත. | මාර්ගෝපදේශය සඳහන් අවශ්‍යතා සමග අනුගතවීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | ඇගයීම් සඳහා උපදේශකවරුන් 2 ඉහත මාර්ගෝපදේශයේ සඳහන් අවශ්‍යතා අනුගමනය කිරීමකින් තොරව ව්‍යාපෘතියේ තනි පුද්ගල උපදේශකවරුන් ලෙස පත්කර තිබුණි. | | |
| (ආ) | මාසික වැඩ සැලැස්මේ නිශ්චිතවම වැඩ සඳහන් කර නොතිබුණු අතර කළ වැඩ වාර්තා මාසික වැඩ සැලැස්ම සමග සංසන්දනය කර නොතිබුණු අතර මාසික වැඩ සැලැස්ම හා කළ වැඩ වාර්තා අතර වෙනස සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිවැරදි වැඩ සැලැස්මක් ලබා ගත යුතු අතර, ගෙවීම් සිදු කරන අවස්ථාවේ දී වැඩ සැලැස්ම සහ මාසය තුළ දී කළ වැඩ සංසන්දනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | වර්තමාන වෙළෙඳපොළ අනුපාතය දැක්වෙන පරිදි ලංසු මිල පිළිගැනීම් හේතුවෙන් පැකේජ 07ක ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා තිබුණු බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | නිවැරදි ඇස්තමේන්තු භාවිත කිරීමට පියවර ගත යුතුය. |

### 3.3 පද්ධති හා පාලනයන්

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති සමාලෝචන කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීමට 2020 වර්ෂය සඳහා වාර්ෂික අයවැය සහ වැඩ සැලැස්ම සම්පූර්ණ කර නොතිබුණි. | කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති සමාලෝචන කමිටුව වෙත වැඩ සැලැස්ම සහ අයවැය ඉදිරිපත් කිරීමට නොහැකි විය. | අයවැය සහ වැඩ සැලැස්ම පිළියෙල කර සමාලෝචන කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා මූල්‍ය කළමනාකරුවකු (පීඑස්-3) සහ ගණකාධිකාරීවරුවන් (පීඑස්-4) නව දෙනෙකු පත් කර තිබුණ ද, ව්‍යාපෘතියේ මූල්‍ය කළමනාකරණ පද්ධතිය හඳුන්වා දී නොතිබුණි. | "Quick Book" යන මෘදුකාංගය මිලදී ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරමින් පවතී. | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍ය කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත පිළියෙල කර නොතිබුණි. | ජාතික සමාලෝචන කමිටුවෙන් අනුමැතිය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිටී. | මූල්‍ය ගිවිසුමට අනුව ව්‍යාපෘති මෙහෙයුම් අත්පොත පිළියෙල කර අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතුය. |